# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO)

## රැකියා ඇබෑර්තු

ශ්‍රී ලංකාවේ බෙදා හැරීමේ උපයෝගිතා සමාගමක් වන සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම, ශාඛා හතක් මගින් මීගමුව සිට ගාල්ල දක්වා වෙරළබඩ තීරය ආවරණය කෙරෙන මෙහෙයුම් ප්‍රදේශයක් ලෙස පාරිභෝගික ජනතාව 500,000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවය සලසන අතර, කාර්ය මණ්ඩලය 1500 කින් සමන්විත වේ. අප ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. පුහුණු විධායක

| | |
|---|---|
| **සුදුසුකම් හා පළපුරුද්ද** | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණ / ව්‍යාපාර කළමනාකරණ / රාජ්‍ය පරිපාලන / වෙනත් අදාළ උපාධියක්<br>හෝ<br>• පිළිගත් වෘත්තීය මානව සම්පත් ආයතනයකින් ලබාගත් වෘත්තීය සුදුසුකම.<br>සහ<br>• සේවක මණ්ඩලය 100 කට වැඩි ආයතනයක වගකීම් සහිත තනතුරක මානව සම්පත් කළමනාකරණ හා පුහුණු කටයුතු පිළිබඳව වසර 05 ක පළපුරුද්ද.<br>යම් අයදුම්කරුවකුහට අදාළ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති (මාස්ටර්ස්) උපාධියක් සතුවේ නම් ඉහත වසර 05 ක පළපුරුද්ද අවශ්‍යතාවය වසර 03 දක්වා අඩුකළ හැක. |
| **වයස** | අවුරුදු 40 ට අඩු විය යුතුය |

### 02. ප්‍රවාහන විධායක

| | |
|---|---|
| **සුදුසුකම් හා පළපුරුද්ද** | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණ / ව්‍යාපාර කළමනාකරණ / රාජ්‍ය පරිපාලන / වෙනත් අදාළ උපාධියක්.<br>හෝ<br>• පිළිගත් වෘත්තීය මානව සම්පත් ආයතනයකින් ලබාගත් වෘත්තීය සුදුසුකම්<br>සහ<br>• සේවක මණ්ඩලය 100 කට නොඅඩු ආයතනයක වගකීම් සහිත තනතුරක පරිපාලන කාර්ය හා වාහන ආශ්‍රිත කටයුතු හැසිරවීම සම්බන්ධව වසර 05 ක පළපුරුද්ද.<br>යම් අයදුම්කරුවකුහට අදාළ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති (මාස්ටර්ස්) උපාධියක් සතුවේ නම් ඉහත වසර 05 ක පළපුරුද්ද අවශ්‍යතාවය වසර 03 ක් දක්වා අඩුකළ හැක. |
| **වයස** | අවුරුදු 40 ට අඩු විය යුතුය |

### 03. නීති නිලධාරි

| | |
|---|---|
| **සුදුසුකම් හා පළපුරුද්ද** | • නීතිඥවරයකු වීම.<br>සහ<br>• සුදුසුකම් ලැබීමෙන් පසු උසාවි හා නොතාරිස් කාර්ය පිළිබඳව වසර 05 ක පළපුරුද්ද. |
| **වයස** | අවුරුදු 40 ට අඩු විය යුතුය |

### 04. විශ්ලේෂක ක්‍රමලේඛ ශිල්පී

| | |
|---|---|
| **අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද** | පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ හෝ පරිගණක විද්‍යා උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්ද.<br>හෝ<br>පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණිතය හෝ භෞතික විද්‍යා උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පළපුරුද්ද. |
| **රැකියාව පිළිබඳ දැනුම** | ජාවා, .නෙට් හා සී. පිළිබඳව ක්‍රමලේඛ දැනුම සමග ව්‍යාපාර ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රබල විශ්ලේෂණ කුසලතා සතුවීම. |
| **අනෙකුත් අවශ්‍යතා** | ප්‍රතිඵලදායි සන්නිවේදන කුසලතා (කථනය හා ලිඛිත දෙවර්ගයම), ප්‍රබල නායකත්ව හා කණ්ඩායම් හැකියාවන්. |
| **වයස** | අවුරුදු 30 ට අඩු විය යුතුය. |

තෝරාගත් අයදුම්කරුවන්හට ආකර්ශණීය වැටුප් සමග ආන්තික ප්‍රතිලාභ රැසක් හිමිවේ.

කරුණාකර ඔබගේ විස්තරාත්මක ජීවදත්ත ඇතුළත් අයදුම්පත, සහතිකවල පිටපත් සමග, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සහිතව, 2020 ජූලි 12 වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

**අයදුම්කරනු ලබන තනතුරු නාමය අදාළ අයදුම්පතෙහි හා කවරයෙහි වම් ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.**

**මානව සම්පත් හා පරිපාලන අංශ ප්‍රධානී,**
**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,**
**03 වන මහල, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.**